කොවිඩ්-19 සම්බන්ධයෙන් ජනමනසට ආතතිය සහ ඉච්ඡාභංගත්වය ඇතිවන අකාරයට නොව, අනාගතය සම්බන්ධයෙන් ධනාත්මක බලාපොරොත්තු සහ එකිනෙකා අතර සහයෝගය ඇති වන ලෙස වාර්තාකරණයන් සිදුකරන ලෙසින් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය විසින් ජනමාධ්‍ය වෙත නිර්දේශ කරයි. එනමුත් ජනමාධ්‍ය මගින් දිගින් දිගටම බිය, ආතතිය, තැතිගැන්වීම් ඇතිකරනා ආකාරයට සිරස්තල යෙදූ පුවත් පළ කරයි. "ස්විස්වලින් ආපු දේවගැති සාතන් මාරක වසංගතයෙන් යාපනේ වැනසූ හැටි" ලෙසින් ඉරිදා මව්බිම සිය ලිපියකට යොදා ඇති සිරස්තලය ඊට කදිම උදාහරණයකි. විශේෂයෙන්ම "මාරක වසංගතය" ලෙසින් කොවිඩ්-19 සම්බන්ධයෙන් සඳහන් කිරීම නොකළ යුතු බව ජාත්‍යන්තර ජනමාධ්‍ය ආචාර ධර්මයන්හි සඳහන් වෙයි.

එසේම නිරෝධායනයට ලක් කරන්නවුන්ගේ/රෝගීන්ගේ/මරණයට පත්වූවන්ගේ ජාතිය හෝ ආගම සඳහන් නොකරන ලෙසින්ද උක්ත නිර්දේශයන්හිම දැක්වේ. මෙහි අදාළ පූජකවරයා දෙමළ ජාතිකයෙකු ලෙසින් සඳහන් කිරීම එයද කඩවී තිබේ.

මෙවන් මොහොතක ජනමාධ්‍ය වඩාත් වගකීමකින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව අපි අවසානයට සිහිපත් කරමු.

මූලාශ්‍ර:

https://www.poynter.org/reporting-editing/2020/how-newsrooms-can-tone-down-their-coronavirus-coverage-while-still-reporting-responsibly/
https://gijn.org/2020/03/10/tips-for-journalists-covering-covid-19/?mc_cid=8142abd169&mc_eid=42cf401880

**#MediaEthicsSL #lka #SinhalaPress #News #COVID19 #Coronavirus #SundayMawbima**